

කොත්තු
ළමයා
කොත්තු
කාමුද?
කොත්තු
ළමයා!

# කොත්තු ළමයා

දුලෝදායා ඔසදි කරුණාරත්න

**කොත්තු ළමයා**

© දුලෝද්‍යා ඔසඳි කරුණාරත්න

ප්‍රථම මුද්‍රණය - 2023 දෙසැම්බර්

**ISBN 978-624-208-119-9**

**IS29028**

කතාව, පිට කවරය සහ චිත්‍ර :

දුලෝද්‍යා ඔසඳි කරුණාරත්න

**35A/1,**

වැවතැන්න පාර,

අම්පිටිය

# ස්තූතිය

මාගේ මේ කතන්දර පොත ලිවීමට උදව් උපකාර කළ මාගේ අම්මා, තාත්තා සහ මල්ලීටත් නිර්මලා සේනාරත්න නැන්දා ඇතුලු පවුලේ සැමටත්, මා නිරන්තරයෙන් දිරිගැන්වූ සමන්මලී සහ මොරීන් විජේකෝන් ගුරු මෑණිවරුන්ටත් මාගේ හද පිරි ස්තූතිය මෙසේ පුද කරමි.

මෙවන් කතන්දර පොතක් එළි දැක්වීමට ලැබීම මගේ සිහිනයක් සැබෑවීමකි. ඔයාලත් සඳුන් වගේ අධික පිටි සහිත කෑම ජාති මොනවත් කන්න එපා!



# පිදුම

මාගේ පාසල වන මහ/ මහමායා බාලිකා විදුහලේ **4-A** ශ්‍රේණියේ පන්ති භාර ගුරුතුමිය වන මොරීන් මංජුලා විජේකෝන් ගුරු මෑණියන්ට මම ලියූ මේ කතන්දර පොත ඉතාම ගෞරවයෙන් පුද කරමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පන්න දැනුමින් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි.එසේනම් පාසලට වහකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මග පෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරවීම ලැබීම පාසල වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වෙන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශය අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යැයි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරන මණ්ඩලය ගුරුභවතුන්, දෙමාපියන්,ආදි ශිෂ්‍යයන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.....

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහමායා බාලිකා විද්‍යාලය- මහනුවර

2023.11.01

# <u>කොත්තු ළමයා</u>

එකෝමත් එක ගමක සඳුන් කියලා ළමයෙක් හිටියා.

එයා හරි පොහොසත්. එයාගේ හොඳම යාලුවා තමයි බණ්ඩා.

නමුත් බණ්ඩා ගොඩාක් දුප්පත්.



සඳුන් ආසයි කොත්තු කන්න.

හැබැයි සඳුන්ගේ තාත්තා සඳුන්ට කොත්තු කන්න

දුන්නේ නැහැ. අධික පිටි සහිත කෑම ජාතියක් නිසා.



බණ්ඩාගේ තාත්තා කොත්තු කඩයක වැඩ කල කොත්තු බාස් කෙනෙක්.

තාත්තා වැඩ කරන හැටි දැකලම, බණ්ඩාත් පුංචි කාලේ ඉදලම කොත්තු හදන්න දන්නවා.



දවසක් සඳුන් බණ්ඩාට මෙහෙම කිව්වා.

සඳුන් : “යාලුවේ මට කොත්තු හදලා දෙන්නකෝ”

බණ්ඩා : “මට පුලුවන්. ඒත් ඔයාගේ තාත්තා මට බනීවි නේ”

සඳුන් : “ඔයා බය වෙන්න එපා. මං ඒක බලාගන්නම්”



එක දවසක් සඳුන් පිටි මල්ලකුත් අරගෙන බණ්ඩාගේ ගෙදර ගියා.

එදා බණ්ඩාගේ අම්මයි, තාත්තයි ගමනක් ගිහින්.

සඳුන් : “ඔයා හෙට මට මේ පිටි මල්ලෙන්ම කොත්තු හදලා ගේන්න ඕනි”



පහුවදා බණ්ඩා පිටි මල්ලෙන්ම කොත්තු හදලා ගෙනාවා.

සඳුන් එක හුස්මට කොත්තු ටික කෑවා. “හරිම රසයි” කිය

කියා. නමුත් හරි වැඩේ තමයි වුණේ. එදා රෑ සඳුන්ගේ බඩ

හොඳටෝම රිදුනා.



සඳුන්ව එවෙලේම දොස්තර ළඟට එක්ක ගෙන ගියා.

දොස්තර සඳුන්ව සෝදිසි කලා.

"මෙයා අධික පිටි සහිත කෑම ජාතියක් මොනවා හරි

කෑමට අරගෙන තියෙනවා" කියලා දොස්තර කිව්වා.

ඊට පස්සේ දොස්තර සඳුන්ට බෙහෙතක් දුන්නා.



පහුවදා සඳුන් තාත්තාට වෙච්ච සිද්ධිය කිව්වා. තාත්තාට හරි හිනා. තාත්තා බණ්ඩාට කොත්තු කඩයක් හදලා දුන්නා. බණ්ඩා ඒකෙන් පොහොසත් වුණා. සඳුන්ට වුණු ඇබැද්දිය මතක් වෙන්නත් එක්ක, බණ්ඩා කඩේට **"කොත්තු ළමයා"** යැයි නම තිබ්බා.



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොතපතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුලින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වර්ෂයේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුන්චි ගත් කතුවරියන්ය.පාසල තුල ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගා වීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.ඒ තුලින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුනුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි.මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟ පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම් කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි.පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිරිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමයා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජන ගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත් කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයකු වීමට ශක්තිය ලැබේවායි පතමු.....

මෙයට
එම්. එම්. සෙනෙවිරත්න
මහ ලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කල ව්‍යාපෘතියෙහි නිර්මාපක
2023.11.01